# දෙවිකුමාණන් ඔබට ප්‍රේම කරනසේක



# දෙවිතුමාණන් ඔබට ප්‍රේම කරනසේක.

ඔබට වඩාත්ම ප්‍රේම කරන්නේ කව්ද කියා ඔබ දන්නවද?

ඒනම් සර්වබලධාරී මැවුම්කාර දෙවියන් වහන්සේය. (එළිදරව් 1:8, උත්පත්ති 1:26,27, 2:7 ). මෙම සදාකාලික දෙවියන් වහන්සේ ඔබට කෙතරම් ප්‍රේමකරනවද කිවහොත්, ඔබේ පාප කමාකිරිම සඳහා තම එක ජාතක පුත්‍රයා කුරුසියේ මරණීය දණ්ඩනය විඳීමට එවූ සේක. (ලූක් 23:34).

දෙවිදුන් ඔබට මෙතරම් ප්‍රේමකරන්නේ මන්දැයි ඔබ දන්නවද?



ඒ එතුමන් තමා ප්‍රේමයේ දෙවිදුන් වන නිසා, තමන් ස්වරූපයටම ඔබ මවා තිබෙන බැවිනි. ඔබගේ ආත්මය අමරණීය වන අතර මුළු ලොවටම වඩා එය දෙවියන් වහන්සේට වටින්නේය (මතෙව් 16:26).

දෙවියන් වහන්සේ ඔබට ප්‍රේමකරන නමුත් පාපයට ද්වේශ කරන නිසා එය විනිශ්චය කරනු ඇත. පාපය දෙවිදුන්ගේ හදවත රිදවයි; එය ඔබ එතුමන්ගෙන් වෙන් කරයි. විනිශ්චය දවසේදී ක්‍රිස්තුස් වහන්සේ පවුකරුවන්ට මෙසේ පවසනවා ඇත: “...සාප ලද්දෙනි, මා වෙතින් ඉවත් වී යක්ෂයාට ද ඔහුගේ දූතයන්ට ද සූදානම් කර තිබෙන සදාතන ගින්නට යන්න...මොවුහු සදාතන

දඬුවමට ද, දැහැමියෝ සදාතන ජීවනයට ද යන්නෝ ය.’’ (මතෙව් 25:41, 46).

මුල් මනුෂ්‍යය ආදම් දෙවිදුන්ට අකීකරු වූ නිසා, පාපය, ශාපය, රෝගය සහ මරණය මෙලොවට ඇතුල් වුනා; අප සැවොම පවුකරුවන් වී, සදාකාලික නිරාගින්නට තීන්දුවී සිටියි. නමුත් දෙවිදුන් තමන් මවනලද මනුසතට ප්‍රේමකරන බැවින්, ක්‍රිස්තුස් වහන්සේගේ මරණය තුලින් ඔවුන් මුදා ගෙන ආදම් තම පාපය සහ අකීකරුකම කරණකොටගෙන අහිමි කරගත් සියලු ආශිර්වාද නැවත අත්කරදුන්සේක. (රෝම 5:1,-21; එපිස 1:-14).




යේසුස් ඔබ වෙනුවෙන් මැරුනේ ඔබ වරදටපත්කරනු නොලැබ, දෙවිදුන් කෙරෙහි විශ්වාසය තැබීමෙන් සදහටම එතුමන් සමග ස්වර්ගයෙහි වසන පිණිසය. “මන්ද, පාපයේ කුලිය මරණයයි; නමුත් දෙවිදුන්ගේ දීමනාව ක්‍රිස්තුස් වහන්සේ තුල සදාකාලික ජීවනයයි.’’ (රෝම 6:23).

දෙවියන්වහන්සේ ඔබට කෙතරම් ප්රේමකරනවද කියා දැන් ඔබට පෙනේ. ඔබ ගලවා ගැනීමට දේවදූතයකු නොඑවා තම පුත්‍රයාණන්වම ලොව මුදවාගැනීමට එවුවේ එතුමන් ඔබට එතරම් ප්රේමකරන නිසයි. ක්රිස්තුස්වහන්සේ මෙසේ වදාල සේක: ‘’දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්රේම කළ සේක් ද කීවොත්, ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන්

වුව ද ලොවට දෙවා වදාළ සේක. එසේ කෙළේ, උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය.”(යොහාන් 3:16). එනමුත් දෙවියන්වහන්සේ ශුධය, යුක්තිසහගතය. උන්වහන්සේ ඔබ පිළිගන්නේ ඔබ ඔබේ පාපගැන පසුතැවිලිවී ක්‍රිස්තුස්වහන්සේගේ පවු නසන යාගය පිළිගතහොත් පමණි. (ජොහාන් 3:3; රෝම 3:24-26). යේසුස්වහන්සේ, ‘‘පසුතැවී සිත් හරවා ගන්න; සුබ අස්න අදහාගන්න’’ යනුවෙන් වදාල සේක. (මාක් 1:15).



එබැවින්, පසුතැවී ක්‍රිස්තුස්වහන්සේ පමණක් ඔබේ පාප වෙනුවෙන් මැරුණු බව අදහාගෙන ඔබගේ පුද්ගලික ගැලවුම් කරු සහ ස්වමියානන් ලෙසට එතුමනන්ව තම හද තුලට පිළිගන්න. දෙවියන්වහන්සේ ස්පීරවශයෙන් ඔබේ සියලු පාප යේසුස්ගේ රුධිරයෙන් සෝදා ඔබ නොකැළැල් කරනසේක. ඔබ දේව වචනයට සවන්දී එයට අවනතවනවිට ශුධාත්මයාණන්වහන්සේ ඔබ දිවිය වෙනස්කොට ඔබට අලුත් හදවතක් දානය කරනසේක. උන්වහන්සේ ඔබ දිවිය විශුධ කොට එතුමන්ගේ ප්‍රේමය, ප්‍රීතිය සහ සමාදානය, ප්‍රඥාව සහ බලය පුරවා දේව රාජ්‍යය වෙනුවෙන් ජීවත්වීමට මග පෙන්වනසේක.



හිත මිතුර, ඔබට ප්‍රේමකරන සර්වබලධාරී දෙවිඳුන්ගේ දේව වචනයට කීකරු වන්න. දැන්ම පසුතැවිලිවී දෙවිඳුන් වෙතට හැරෙන්න. ඔබට ඇත්තේ එක දිවියයි; ඔබ හදිසියේම මිය යා හැක; ඒ කවදද, කෙසේද යැයි ඔබ නොදනී. නමුත් දෙවියන්වහන්සේ, එතුමන්ගේ මහත් දයාව නිසා, ඔබට සදාකාලයට සුදානම්වීම සඳහා අවස්ථාවක් ලබා දෙනසේක. දෙවිඳුන්ගේ පව් කමාව නැතුව ඔබව ගිනිවිලට හෙලනු ලැබේ : එහිදී ''ඔවුන් කාදමන පණුවා නොනසියි, ඔවුන් දවාලන ගින්න ද නොනිවෙයි.'' (මාර්ක් 9:48) මරණින් පසු පව් කමාවක් නැත, ඇත්තේ දේව විනිශ්චය පමණි (හෙබ්‍රෙව් 9:27). යේසුස්ක්‍රිස්තුස් උත්ථානය සහ ජීවනය වන සේක. එතුමන් ඔබව මළවුන්ගෙන් උත්ථානකොට ඔබගේ ක්‍රියා අනුව ඔබ විනිශ්චය කරන සේක.
(යොහාන් 11:25; යොහාන් 5:24-29). සිතන්න, දැන්ම ක්‍රියාත්මක වන්න. මරණ මොහොතේදී ඔබට දෙවියන්වහන්සේටද, උන්වහන්සේගේ විනිශ්චයටද සදාකාලයට ද මුහුණදීමට සිදුවේ! ඔබ පව්කරුවකු බව පිළිගෙන ඒ බව පවසන්න.පැමිණෙන්නට තිබෙන දේව උදහස සහ විනිශ්චයෙන් ඔබව මුදාගැනීම සඳහා, ඔබට ස්වාමිවූ යේසුස්ක්‍රිස්තුස් නමැති මිදුම්කරුවකු අවශ්‍යවේ. දැන් ඔබ අවංක හදවතකින් දෙවිඳුන්ට ඔබේ පාප කමකරන්න කියා මෙලෙස යදින්න.

## යාඥාව :



"ආදරණීය දෙවිඳුනි,
පව්කරුවෙකුවූ මාහට කමාවුව මැනව. යේසුස්වහන්සේ වින්දාවූ මරණය මා විසින් විඳිය යුතුව තිබුණු දඬුවමයි. මගේ සියලු පව් ගැන මම පසුතැවිලිවී දැන් ඔබ වෙතට හැරෙමි. මගේ ගැලවීම උදෙසා කුරුසියේ දුක්විඳ මරණයට පත්වී, භූමිදානය කරනු ලැබ, නැවත උත්ථානවූ ඔබගේ ඒකජාතක පුත්‍ර යේසුස්ක්‍රිස්තුස් වහන්සේ මම ප්‍රකාශකොට අදහාගනිමි. කාරුණිකව එතුමන්ගේ රුධිරයෙන් මා සෝදා මා ඔබගේ දරුවකු කරනු මැන. මගේ පුද්ගලික ගැලවුම්කරු හා මගේ ජීවිතයේ ස්වාමියා ලෙසට මම දැන් යේසුස් හට මා හද තුලට වඩිනමෙන් ආරාධනා කරමි. අද පටන් ඔබ වෙනුවෙන් ජීවත්වීමට මට පිහිටවුව මැනව. මගේ පියාණනි, මගේ ආත්මය ගලවා ගත් නිසා ඔබවහන්සේට ස්තුතිකරමි. යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලමි!
ආමෙන්."

**ජීවමාන දෙවිතුමාණන් දරුවෙකු වීම කොතරම් භාග්‍යයක්ද! නිරතුරුවම ඔබව ගලවා ගන්න නිසා දෙවිතුමාණන්ට ස්තුති පුදන්න.**

